කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල
**Zonal Education Office - Piliyandala**

දෙවන වාර ඇගයීම - 2017
**Second Term Evaluation -2017**

| | | |
|---|---|---|
| ගණිතය I/II<br>**Mathematics I/II** | 6 ශ්‍රේණිය<br>**Grade 6** | පැය දෙකයි<br>***Two Hours*** |

නම :- ............................................................ විභාග අංකය :- ......................................

## I කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
❖ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.

1. එකතු කරන්න. 4550 + 72 + 1

2. 502348 සංඛ්‍යාවේ 2 හි ස්ථානීය අගය ලියන්න.

3. 10 හා 1000 අතර පිහිටි කුඩාම ඉරට්ට සංඛ්‍යාව සහ විශාලතම ඔත්තේ සංඛ්‍යාව ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com


4. $\frac{3}{6}$ සඳහා තුල්‍ය භාගයක් නොවන්නේ,

   (i) $\frac{1}{2}$ (ii) $\frac{6}{12}$ (iii) $\frac{16}{24}$ (iv) $\frac{25}{50}$


5. 2, 5, 10 යන සංඛ්‍යා තුනෙන්ම ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාව කුමක් ද?

   (i) 351 (ii) 205 (iii) 6200 (iv) 2052

6. පහත තල රූපවල පරිමිතින් සොයන්න.




..............................




..............................

7. 5 වන හතරැස් සංඛ්‍යාව ලියන්න.

8. {0, 1, 2, 3, 4, 5, 6, 9} මෙම සමූහය හැඳින්වීම සඳහා පමණක්ම යොදා ගත හැකි වචනය වන්නේ, ........................................ වේ.

9. මුහුණත් ගණනත්, ශීර්ෂ ගණනත් සමාන වූ ඝන වස්තුව කුමක්ද?

10. ආරෝහණ පිළිවෙලට සකස් කරන්න.

$\frac{3}{4}, \frac{3}{8}, \frac{3}{5}, \frac{3}{10}$

11. පහත දැක්වෙන දශම සංඛ්‍යා යුගල >, < හෝ = සංකේත යොදා සම්බන්ධ කරන්න.

(i) 3.18 ....... 3.178 (ii) (12 - 7) ........ (19 - 14)

12. රේන්ද මීටරයක මිල රු 70 නම් රේන්ද මීටර් 5 ක මිල සොයන්න.

13. $5258ml$ මෙම දියර ප්‍රමාණය ලීටර් හා මිලිලීටර් වලින් දක්වන්න.

14. 27 හි සියලු සාධක ලියන්න.


15. $100m$ දිවීමේ තරගයකදී ක්‍රීඩකයන්ට ගතවන කාලය මැනීමට වඩාත් සුදුසුම උපකරණය කුමක්ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

16. රූපයේ $a$ හා $b$ කෝණ වර්ග නම් කරන්න.

$a$ - ..........................


$b$ - ..........................





17. 2 න් බෙදූ විට 1 ක් ඉතිරිවන සේත්, 3 න් බෙදූ විට 2 ක් ඉතිරිවන සේත්, බෙදිය හැකි සංඛ්‍යාවක් ලියන්න.

18. බයිසිකල්කරුවෙක් $A$ නම් ස්ථානයක සිට $50m$ ක් නැගෙනහිර දිශාවට ගමන් කර එතැන් සිට උතුරු දිශාවට නැවත $50m$ ගමන් කර $B$ නම් ස්ථානයට පැමිණේ. $B$ පිහිටන්නේ $A$ ට කවර දිශාවෙන්ද?

19. මෙම ගණක රාමුවෙන් නිරූපණය වන අගය වන්නේ,




20. දී ඇති තලරූප නම් කරන්න.




.......................... .......................... .......................... ..........................

## II කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, ඉතිරි ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.
- පිළිතුරු ලිවීම සඳහා වෙනත් කඩදාසි භාවිතා කරන්න.

1. ඔබ පන්ති කාමරයේදී ඝන වස්තු පිළිබඳ ඉගෙනීම සඳහා සිදුකරන ලද ක්‍රියාකාරකම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) මෙම පතරොම ඇසුරින් සෑදිය හැකි ඝන වස්තුව කුමක්ද?

(ii) එම ඝන වස්තුවේ මුහුණත් කුමන තලරූප වර්ගයට අයත්ද?

(iii) එම ඝන වස්තුවේ මුහුණත් ගණන, ශීර්ෂ ගණන හා දාර ගණන වෙන වෙනම ලියන්න.

(iv) ඉහත ඝන වස්තුවේ මුහුණත් ගණන, ශීර්ෂ ගණන හා දාර ගණනට සමාන වූ වෙනත් ඝන වස්තුවක් නම් කරන්න.

(v) එය මුලින් හඳුනාගත් ඝන වස්තුවෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(vi) ත්‍රිකෝණාකාර මුහුණත් පමණක් සහිත ඝන වස්තුවක් නම් කරන්න.

(vii) එහි පතරොම සඳහා දළ රූප සටහනක් අඳින්න.

2. (a) එකතු කරන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(i) $\frac{1}{4} + \frac{1}{4}$

(ii) $\frac{3}{8} + \frac{1}{4}$

(iii) ඒකක භාග සඳහා උදාහරණ දෙකක් ලියන්න.

(b) (i) $-3$ සිට $+3$ දක්වා විහිදෙන සංඛ්‍යා රේඛාවක් අඳින්න.

(ii) එය මත $A = (-2), B = (+1), C = 0$ වන සේ $A, B$ හා $C$ ලක්ෂ්‍යයන් ලකුණු කරන්න.

(iii) $<, >$ යන සංකේත භාවිතා කරමින් සංඛ්‍යා රේඛාව මත $A, B$ හා $C$ ලක්ෂ්‍යය සඳහා ඔබ කැමති සැසඳුම් 2 ක් ලියන්න.

3. (අරලියා, ගස්ලබු, පේර, රෝස, නෙල්ලි, දාස්පෙතියා, ඇපල්, ජම්බු)

(i) ඉහත දී ඇති ද්‍රව්‍යයන්ගේ පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන්කර ඒවා රවුම් 2 ක් තුළ ලියන්න.

(ii) එසේ වෙන් කිරීමේදී සැලකිල්ලට ගත් පොදු ලක්ෂණ පැහැදිලි කරන්න.

(iii) සැලකිල්ලට ගත් පොදු ලක්ෂණ මත එම කාණ්ඩ නම් කරන්න.

(iv) ඉහත තේරීම් හා කාණ්ඩ කිරීම් ප්‍රායෝගිකව භාවිතා කරන අවස්ථා 2 ක් ලියන්න.

4. (a) (i) හිස්තැන් පුරවන්න.

$1 \times \square = 12$

$\square \times 6 = 12$

$3 \times \square = 12$

To download past papers visit
www.vajirapani.blogspot.com

(ii) ඉහත ඇති ගුණිත ආධාරයෙන් 12 හි සියලු සාධක ලියන්න.

(iii) 2 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යාවල එකස්ථානයේ තිබිය හැකි සංඛ්‍යා මොනවාද?

(b) බිත්ති සැරසිල්ලක් සෑදීමට සිතූ නිර්මාල්ට රතුපාට රිබන් $100cm$ කැබලි 4 ක් ද, නිල්පාට රිබන් $50cm$ කැබලි 3 ක් ද අවශ්‍ය විය. අවශ්‍ය වූ මුලු රිබන්වල දිග ගණනය කරන්න.

5. පාසලක "ගණිත දිනය" පැවැත්වීම සඳහා සකස් කරන ලද න්‍යාය පත්‍රයක කොටසක් පහත දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පෙ.ව. 8.30 - ප්‍රධාන ආරාධිතයා පැමිණීම.
පෙ.ව. 8.35 - ප්‍රධාන ආරාධිතයා වේදිකාවට කැඳවාගෙන යාම.
පෙ.ව. 8.45 - පිළිගැනීමේ කථාව.
පෙ.ව. 8.55 - පොල් තෙල් පහන දැල්වීම.
පෙ.ව. 9.00 - "විනෝදයෙන් ගණිතය" නාට්‍යය.

(i) ප්‍රධාන ආරාධිතයා පැමිණි වේලාව සම්මත ආකාරයට ලියන්න.

(ii) පිළිගැනීමේ කථාවට වෙන්කර තිබූ කාලය සොයන්න.

(iii) පොල්තෙල් පහන දැල්වූයේ නියමිත වේලාවට වඩා මිනිත්තු 13 ක් ප්‍රමාද වී නම් පහන දැල්වූ වේලාව කීයද?

(iv) වැඩසටහන අවසන් වූයේ ප.ව. 12.40 ට නම් මුළු වැඩසටහන සඳහා ගතවූ කාලය සොයන්න.

(v) වැඩසටහන අවසන් වීමෙන් පසු පිරිසිදු කිරීම් සිදුකර සිසුන් පාසලින් පිටත් වූ වේලාව ප.ව. 1.45 නම් එම වේලාව පැය 24 ඔරලෝසුවෙන් සම්මත ආකාරයෙන් දක්වන්න.

6. (i) 1 සිට 10 තෙක් ඇති ගණින සංඛ්‍යා ලියන්න.

(ii) එම සංඛ්‍යා ඇසුරින්,

a) ඔත්තේ සංඛ්‍යා වෙන්කර ලියන්න.
b) ඉරට්ට සංඛ්‍යා වෙන්කර ලියන්න.
c) ප්‍රථමක සංඛ්‍යා වෙන්කර ලියන්න.

(iii) පළමු ත්‍රිකෝණ සංඛ්‍යා 3 ලියන්න.

(iv) තුන්වන ත්‍රිකෝණ සංඛ්‍යාව තිත් රටාවක් මගින් නිරූපණය කරන්න.

7. මිශ්‍ර පළතුරු බීමක් සෑදීම සඳහා අඹ යුෂ $750ml$ ක් ද, දොඩම් යුෂ $450ml$ ක් ද, පැපොල් යුෂ $200ml$ ක් ද අවශ්‍ය වේ.

(i) ඒ සඳහා අවශ්‍යවන මුළු යුෂ ප්‍රමාණය මිලිලීටර කීයද?

(ii) එය ලීටර් වලින් දක්වන්න.

(iii) පානය සඳහා බීම සෑදීමට එයට තවත් ජලය $1500ml$ ක් එකතු කළ යුතුව ඇත. එවිට සෑදෙන මුළු බීම ප්‍රමාණය ලීටර් කීයද?

(iv) මෙම බීම ප්‍රමාණය $3l$ ක බෝතලයකට පිරවිය හැකිද?

(v) එසේ පිරවීමේදී මදි හෝ වැඩිවන බීම ප්‍රමාණය කොපමණ ද?